(දසවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

අංක 79.]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

**2025 සැප්තැම්බර් 09 අඟහරුවාදා පූ.භා. 9.30 ට**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1.

1105/2025

ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා,— ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මාර්ග සංවර්ධන අධිකාරියට (RDA) ස්ථිර අධ්‍යක්ෂකවරුන් 39 දෙනෙකු පත් කිරීම සඳහා වර්තමාන රජය විසින් අදියරෙන් අදියර සම්මුඛ පරීක්ෂණ පැවැත්වූ බවත්;

(ii) එම සම්මුඛ පරීක්ෂණවලදී පළාත් අධ්‍යක්ෂකවරුන් 05ක් සහ අධ්‍යක්ෂකවරුන් 34 දෙනෙක් තෝරා ගෙන අධිකාරියේ සභාපතිවරයා විසින් අධ්‍යක්ෂ මණ්ඩල අනුමතිය සඳහා යොමු කර ඇති බවත්;

(iii) මාස හයක් පමණ ගතවී තිබුණද, මේ වනතෙක් එම පත්වීම් ලබාදී නොමැති බවත්;

(iv) එම අධිකාරියේ වර්ෂ ගණනාවක සිට සේවය කරන ලද සේවකයන්, විශ්‍රාම ගැන්වීමට ආසන්න කාලයේදී උසස්වීම් අපේක්ෂා කරන අතර එය සාධාරණ බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) මේ දක්වා ඉහත පත්වීම් ලබා නොදීමට හේතු කවරේද;

(ii) ඉහත පත්වීම් ලබා දීමට බාධා තිබේද;

(iii) එම බාධා කවරේද;

(iv) එම බාධා ඉවත් කිරීම සඳහා කටයුතු කරන්නේද;

(v) ඉහත පත්වීම් ලබා දීමේ ප්‍රමාදය, රජයේ කාර්යක්ෂමතාවයට අහිතකර ලෙස බලපාන බව දන්නේද;

(vi) ඉහත සඳහන් පත්වීම් ලබා දෙන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2.

1112/2025

ගරු රොෂාන් අක්මීමන මහතා,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) නැගෙනහිර පළාතේ රජයේ පාසල්වල උග්‍ර ගුරු හිඟයක් පවතින බව පිළිගන්නේද;

(ii) එසේ නම්, එම පළාතේ පවතින ගුරු පුරප්පාඩු සංඛ්‍යාව එක් එක් දිස්ත්‍රික්කය සහ විෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3.

1118/2025

ගරු ලුතිනන් කොමාණ්ඩර් (විශ්‍රාමික) ප්‍රගීත් මධුරංග මහතා,— ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සක්‍රිය සේවයේ යෙදී සිටිය යුතු වුවත්, ආබාධිත වීම හේතුවෙන් සක්‍රිය සේවයේ නොයෙදෙන හමුදා සාමාජිකයන් වෙනුවෙන් සිය ආබාධිත තත්ත්වය නිසාම ලබා දෙන සහන/දීමනා කවරේද;

(ii) එම ආබාධිත හමුදා සාමාජිකයන් වෛද්‍ය හේතූන් මත විශ්‍රාම ගැන්වූ පසු මියගියහොත් ඔවුන්ගේ යැපෙන්නන්ට ලබා දෙන සහන/දීමනා කවරේද;

(iii) එම සහන/දීමනා ප්‍රමාණවත්ද;

(iv) නොඑසේ නම්, එම සහන/දීමනා ඉහළ නැංවීමට ක්‍රියා කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) සක්‍රිය සේවයේ යෙදී සිටින ආබාධිත යුධ හමුදා සාමාජිකයන් විශ්‍රාම ගැන්වීමට පෙර මියගියහොත් ඔවුන්ගේ යැපෙන්නන්ට ලබා දෙන සහන/දීමනා කවරේද;

(ii) ආබාධිත වීම හේතුවෙන් සේවයට වාර්තා නොකරන ලද, පසුව සේවය අනවශ්‍ය යැයි යන පදනම මත සේවයෙන් ඉවත් කරන ලද යුධ හමුදා සාමාජිකයන්ට සිය ආබාධිත තත්ත්වය නිසා යම් සහනයක්/දීමනාවක් මේ වනවිට ලබා දෙන්නේද;

(iii) නොඑසේ නම්, ඊට හේතු කවරේද;

(iv) ඔවුන්ට සහනයක්/දීමනාවක් ලබා දිය යුතු බව පිළිගන්නේද;

(v) එසේ නම්, ඒවා ලබා දීමට පියවර ගෙන තිබේද;

(vi) එම පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4.

1158/2025

ගරු කිට්නන් සෙල්වරාජ් මහතා,— වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) බදුල්ල දිස්ත්‍රික්කයේ, ඇල්ල ප්‍රාදේශීය සභාවට අයත්, කළුගල්ල වතුයායේ මුළු ඉඩම් ප්‍රමාණයෙන් අක්කර 53ක් වූ, තේ වගාව සහ අති සුඛෝපභෝගී බංගලාව සහිත ඉඩමේ අයිතිකරු ඉන්දියාවේ සිටින බවත්;

(ii) එම ඉඩම් සඳහා ව්‍යාජ අයිතිකරුවෙක් ඉදිරිපත්වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත ඉඩමට බලහත්කාරයෙන් ඇතුළුවී තේ දළු නෙළීම නීති විරෝධී බව පිළිගන්නේද;

(ii) ඉහත ඉඩමේ අයිතිය නිරවුල් නොමැති බැවින් එම ඉඩම රජයට පවරා ගැනීමට කටයුතු කළ හැකිද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5.

1175/2025

ගරු මංජුල සුගත් රත්නායක මහතා,— නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අම්පාර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් පිළිවෙළින් 1997, 1999, 2002 සහ 2006 වර්ෂවල ක්‍රියාත්මක කරන ලද පුනස්ථාපන, දිගාමඩුලු ජන උදාන, නාමල් උයන හා දිසායුගම සහ ලෝක ජනාවාස දයාපුර යන නිවාස ව්‍යාපෘතිවල ඉඩම් පවරා ගෙන අදාළ ප්‍රතිලාභීන් වෙත ඔප්පු ලබාදී නොමැති බව දන්නේද;

(ii) ඒ අතරින් පුනස්ථාපන, දිගාමඩුලු ජන උදාන සහ ලෝක ජනාවාස යන නිවාස ව්‍යාපෘති සඳහා ඉඩම්ලාභීන් විසින් මුදල් එකතු කර, වට මැන, අදාළ වාර්තා අධිකාරිය වෙත යොමු කර ඇතත් මේ වනතෙක් ඉඩම් පවරා ගැනීමට අදාළ ඉල්ලීම් අම්පාර ප්‍රාදේශීය ලේකම් වෙත අමාත්‍යාංශය හරහා යොමු නොකිරීමට හේතු කවරේද;

(iii) එම ඉඩම් පවරා ගැනීමේ ඉල්ලීම අමාත්‍යාංශ ලේකම් හරහා අම්පාර ප්‍රාදේශීය ලේකම්ට යොමු කිරීමට ගත වන කාලය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත නිවාස ව්‍යාපෘතිවලට අමතරව අම්පාර දිස්ත්‍රික්කය තුළ මේ වනතෙක් ප්‍රතිලාභීන්ට ඔප්පු ලබාදී නොමැති නිවාස ව්‍යාපෘති තිබේද;

(ii) එසේ නම්, ඒවා කවරේද;

(iii) එම ඔප්පු ලබා දීම ප්‍රමාද වීමට හේතු කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

6.

1178/2025

ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) කිළිනොච්චි දිස්ත්‍රික්කයේ —

(i) ස්ථිර පදිංචි පවුල් සංඛ්‍යාව සහ ඔවුන්ට අයත් ඉඩම් ප්‍රමාණය;

(ii) පදිංචි, සින්නක්කර ඉඩම් ඔප්පු හිමි පවුල් සංඛ්‍යාව සහ පුද්ගලයන් සංඛ්‍යාව;

(iii) පදිංචි, ඉඩම් බලපත්‍ර හිමි පවුල් සංඛ්‍යාව සහ පුද්ගලයන් සංඛ්‍යාව;

(iv) පදිංචි, එහෙත් මේ වනවිටත් සින්නක්කර ඉඩම් ඔප්පු හෝ බලපත්‍ර නොමැති පවුල් සංඛ්‍යාව සහ පුද්ගලයින් සංඛ්‍යාව;

(v) ඇති, බලපත්‍ර සහිත කුඹුරු ඉඩම් සහ ගොඩ ඉඩම් ප්‍රමාණය;

වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) කිළිනොච්චි දිස්ත්‍රික්කයේ අවුරුදු 60කට අධික කාලයක් ජීවත්වන පුද්ගලයන්ට මේ වනතෙක් සින්නක්කර ඔප්පු ලබා නොදීමට හේතුව කවරේද;

(ii) සින්නක්කර ඔප්පු නොමැති වීම හේතුවෙන් බැංකු සහ මූල්‍ය ආයතනවලින් ණය හා උකස් සේවා ලබා නොදීමෙන් ඔවුන්ට තම ආර්ථිකය වර්ධනය කර ගැනීමට නොහැකිව සිටින බව දන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

7.

1234/2025

ගරු අරවින්ද සෙනරත් මහතා,— විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) විදේශ රැකියා ලබා දෙන ආයතනවල නම් කවරේද;

(ii) නීත්‍යානුකූලව ගිවිසුම් ගතවූ ආයතන පමණක් විදේශ රැකියා ලබා දෙන්නේද;

(iii) නීත්‍යානුකූලව ගිවිසුම් ගත නොවූ ආයතන විදේශ රැකියා ලබා දෙන්නේ නම්, එම ආයතනවල නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) විදේශ රැකියා ලබා දීමේදී, නීත්‍යානුකූල නොවන ආකාරයට රැකියා ලබාදෙන ආයතන විසින් මුදල් වංචා සිදු කරන්නේද;

(ii) එසේ නම්, එම ආයතන විසින් වංචා කර ඇති මුදල කොපමණද;

(iii) මුදල් අය කර එහෙත් රැකියා ලබාදී නොමැති ආයතනවලට එරෙහිව ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

8.

1236/2025

ගරු කේ. කාදර් මස්තාන් මහතා,— රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මන්නාරම දිස්ත්‍රික්කයේ, මුසලි ප්‍රාදේශීය සභාවට අයත්, වේප්පම්කුලම් සිට සිලාවතුරෙ දක්වා වූ අභ්‍යන්තර මාර්ගය 2010 වර්ෂයේදී එවකට නැවත පදිංචි කිරීමේ හා ආපදා සහන සේවා අමාත්‍යාංශය විසින් ප්‍රතිසංස්කරණය කරන ලද බව දන්නේද;

(ii) ඉහත මාර්ගයේ දුර කොපමණද;

(iii) එම මාර්ගය කුමන ගම්මානයක් ඔස්සේ දිවෙන්නේද;

(iv) එහි ප්‍රතිසංස්කරණ කටයුතු ආරම්භ කරන ලද දිනය සහ අවසන් කරන ලද දිනය වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීමට අදාළව සමාගම සමඟ එළඹි ගිවිසුමේ පිටපතක් ඉදිරිපත් කරන්නේද;

(ii) ගිවිසුමට එළඹෙන අවස්ථාව වනවිට සමාගමේ හිමිකරුවන් කවුරුන්ද;

(iii) එම මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම සඳහා සමාගමට වෙන් කරන ලද මුදල කොපමණද;

(iv) ඉහත මාර්ගය ප්‍රතිසංස්කරණය කර නොමැති බවත්, ඒ සඳහා වංචා සහගත ලෙස මුදල් ලබා ගෙන ඇති බවත් දන්නේද;

(v) එසේ නම්, ඒ සම්බන්ධයෙන් ගනු ලබන පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

9.

1241/2025

ගරු තිළිණ සමරකෝන් මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අනුරාධපුර දිස්ත්‍රික්කයේ ඉඩම්, වාර්ෂික හෝ දීර්ඝ කාලීන බදු පදනම මත ලබාදී තිබේද;

(ii) ඉපලෝගම සහ කැකිරාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල ඉඩම්, සංවර්ධනය කිරීමට බදු පදනම මත ලබාදී තිබේද;

(iii) එසේ නම්, එම ඉඩම් ප්‍රමාණය සහ ඒවා ලබාදී ඇති කාල සීමාවන් වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) අංක 519-ඉහලකාගම, අංක 621-ඉහලගම සහ අංක 618-කරඹවත්ත යන ග්‍රාම නිලධාරී වසම්වල බදු පදනම මත ලබාදී ඇති ඉඩම් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඒ සඳහා බදු ගිවිසුම් අත්සන් කර තිබේද;

(iii) එසේ නම්, අදාළ පාර්ශ්වයන් කවරේද;

(iv) එම එක් එක් ඉඩමේ විශාලත්වය සහ බදු කාල සීමාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) එම ඉඩම් සංවර්ධනය කර තිබේද;

(vi) සංවර්ධනය නොකරන ලද ඉඩම් නැවත පවරා ගෙන තිබේද;

(vii) ඉහත ඉඩම් අතුරු බදු ලබාදී තිබේද;

(viii) ඉහත ඉඩම් වටා අලිවැට ඉදිකර ඇති බව දන්නේද;

(ix) ඒ සඳහා අවසර ලබා ගෙන තිබේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

10.

1250/2025

ගරු නන්ද බණ්ඩාර මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කෑගල්ල දිස්ත්‍රික්කයේ ඇති, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත් ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර් කොපමණද;

(ii) එම ඉඩම් අතරින් මේ වනවිට කර්මාන්ත සඳහා ලබාදී ඇති ඉඩම් ප්‍රමාණය කොපමණද;

(iii) එම එක් එක් ඉඩම ලබාදී ඇති පුද්ගලයාගේ නම සහ ලබාදී ඇති වර්ෂය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) ඉහත (i)හි සඳහන් ඉඩම් අතරින් මේ දක්වා කිසිදු සංවර්ධන කටයුත්තකට භාවිතා කර නොමැති ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර් කොපමණද;

(v) ඉහත (i)හි සඳහන් ඉඩම් අතරින් විකල්ප ඉඩම් බෙදාදී තිබේද;

(vi) එම විකල්ප ඉඩම් ලබා ගත් පුද්ගලයන්ගේ නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත වැඩකටයුතු

*1.

විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනා සම්මතය,— 2025.08.21 වැනි දින ඉදිරිපත් කරන ලද ආයෝජන ප්‍රවර්ධන සහ අන්‍යෝන්‍ය වශයෙන් සුරක්ෂණය පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ එක්සත් අරාබි එමීර් රාජ්‍යය අතර 2025 පෙබරවාරි 12 දින අත්සන් කරනු ලැබුවා වූ ගිවිසුම, එම විදේශ රාජ්‍යයේ ජාතිකයන්ගේ හෝ එම රාජ්‍යයේ නීති ප්‍රකාර සංස්ථාගත කරන ලද නැතහොත් සංස්ථාපනය කරන ලද සංස්ථාවල, සමාගම්වල හෝ වෙනත් සංගම්වල ආයෝජන ශ්‍රී ලංකාවේදී ප්‍රවර්ධනය කිරීම සහ සුරක්ෂා කිරීම සඳහා වන ගිවිසුමක් වන බැවින්, ජාතික ආර්ථිකයේ වර්ධනයට අත්‍යවශ්‍ය වන්නක් ලෙස අනුමත කළ යුතු යැයි, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 157 ව්‍යවස්ථාව ප්‍රකාරව මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*2.

සමථකරණ (සිවිල් සහ වාණිජ ආරාවුල්) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*3.

ජාතික විගණන (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*4.

නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යතුමා,— පරිපූරක මුදල,— ශීර්ෂය 123 — වැඩසටහන 02— † 2025 ජනවාරි 01 දිනෙන් ආරම්භ වන හා 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන මුදල් වර්ෂයේ ප්‍රයෝජනය සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඒකාබද්ධ අරමුදලෙන් හෝ රජයට අයත් අනිකුත් ඕනෑම අරමුදලකින් හෝ මුදලකින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අභිමතය පරිදි රජය විසින් ලබා ගන්නා ලද ඕනෑම ණය මුදලකින් රුපියල් දහතුන් බිලියන දෙසිය අසූපස් මිලියන හයසිය දහසක් (රු. 13,285,600,000) නොඉක්මවන අතිරේක මුදලක් ගෙවිය යුතු බවටත් එකී මුදල මෙහි ඇති උපලේඛනයේ දක්වා ඇති පරිදි වියදම් කළ යුතු බවටත්, මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි:—

**උපලේඛනය**

| | | | | |
|---|---|---|---|---|
| **ශීර්ෂය** | **123** | - | නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යවරයා | |
| **වැඩසටහන** | **02** | - | සංවර්ධන වැඩසටහන | |
| | | | මූලධන වියදම් | රු. 13,285,600,000 |
| | | | **මුළු එකතුව** | **රු. 13,285,600,000** |

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

† 2025 අගෝස්තු 22 දින ඉදිරිපත් කරන ලද 2025 අංක 1 දරන පරිපූරක ඇස්තමේන්තුව බලන්න.

*5.

කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යතුමිය,— පරිපූරක මුදල,— ශීර්ෂය 171 — වැඩසටහන 02— † 2025 ජනවාරි 01 දිනෙන් ආරම්භ වන හා 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන මුදල් වර්ෂයේ ප්‍රයෝජනය සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඒකාබද්ධ අරමුදලෙන් හෝ රජයට අයත් අනිකුත් ඕනෑම අරමුදලකින් හෝ මුදලකින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අභිමතය පරිදි රජය විසින් ලබා ගන්නා ලද ඕනෑම ණය මුදලකින් රුපියල් මිලියන එක්දහස් පන්සියයක් (රු. 1,500,000,000) නොඉක්මවන අතිරේක මුදලක් ගෙවිය යුතු බවටත් එකී මුදල මෙහි ඇති උපලේඛනයේ දක්වා ඇති පරිදි වියදම් කළ යුතු බවටත්, මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි:—

**උපලේඛනය**

| | | | | |
|---|---|---|---|---|
| **ශීර්ෂය** | **171** | - | කාන්තා හා ළමා කටයුතු අමාත්‍යවරිය | |
| **වැඩසටහන** | **02** | - | සංවර්ධන වැඩසටහන | |
| | | | පුනරාවර්තන වියදම් | රු. 1,500,000,000 |
| | | | **මුළු වියදම** | **රු. 1,500,000,000** |

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

† 2025 අගෝස්තු 22 දින ඉදිරිපත් කරන ලද 2025 අංක 2 දරන පරිපූරක ඇස්තමේන්තුව බලන්න.

පරිපූරක ඇස්තමේන්තු අංක 1 එකතුව රු. 13,285,600,000

*6.

ජනාධිපතිවරයන්ගේ හිමිකම් (ඉවත් කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*7.

ජාතික ගොඩනැඟිලි පර්යේෂණ ආයතනය පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*8.

දණ්ඩ නීති සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.
(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*9.

පෞද්ගලික දත්ත ආරක්ෂණ (සංශෝධන) පනත් කෙටුම්පත — කාරක සභාව.

*10.

බටලන්ද නිවාස යෝජනා ක්‍රමයේ නීති විරෝධී රැඳවුම් ස්ථාන හා වධකාගාර පිහිටුවා පවත්වාගෙන යාම පිළිබඳ පරික්ෂණ කොමිෂන් සභාවේ වාර්තාව,— විවාදය කල් තබන ලද ප්‍රශ්නය (2025 අප්‍රේල් 10),— "2025 මාර්තු 14 දින පාර්ලිමේන්තුවේ දී සභාගත කරන ලද බටලන්ද නිවාස යෝජනා ක්‍රමයේ නීති විරෝධී රැඳවුම් ස්ථාන හා වධකාගාර පිහිටුවා පවත්වාගෙන යාම පිළිබඳ පරික්ෂණ කොමිෂන් සභාවේ වාර්තාව පාර්ලිමේන්තුව විසින් සලකා බලනු ලැබිය යුතු ය." යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

**** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.***